විවිධ අවස්ථාවන් තුළදී පුවත් වාර්තාවන්ට සම්බන්ධ වන බාලවයස්කරුවන්ගේ අනන්‍යතාවය හෙළි නොකිරීම සම්බන්ධයෙන් මාධ්‍ය ආචාර ධර්මයන් තුළ විශේෂ අවධානයක් යොමුවී තිබේ. යම් කිසි පුවත් වාර්තාවක් ඔස්සේ අනන්‍යතාවය හෙළිදරවු වීම තුළින් බාලවයස්කරුවෙකුට සිය පාසැල් අධ්‍යාපනය අනවශ්‍ය බාධාවන් හෝ අතපෙවීම් වලින් තොරව සම්පූර්ණ කරගැනීමට නොලැබීමේ අවදානමක් තිබේ නම්, එහිදී එම අනන්‍යතාවය ආරක්ෂා කළ යුතු වේ. එසේම ලිංගික අපයෝජනයකට ලක්වූ බාලවයස්කරුවෙකු සම්බන්ධ ඕනෑම මාධ්‍ය වාර්තාවක බාලවයස්කරුගේ අනන්‍යතාවය කිසි ලෙසකින් හෙළිදරවු නොකළ යුතු වේ.

පසුගිය දිනක ඝාතනයට ලක්ව අපවත්වූ හිමිනමක පිළිබඳ පුවත් වාර්තාවන් බොහෝ මාධ්‍ය ඔස්සේ පළවී තිබිණි. මෙහිදී විවිධ මාධ්‍ය තුළ අඩන්තේට්ටම් වලට සහ/හෝ ලිංගික අපයෝජනයට ලක්වූවේ යැයි පැවසෙන බාලවයස්කාර සාමණේර හිමි නමකද මෙම සිදුවීමට අදාළ වේ යැයි දැක්වී තිබිණි. මේ පිළිබඳ වූ මව්බිම පුවත් වාර්තාව තුළ (01/06) මෙම බාලවයස්කාර සාමණේර හිමිනමගේ ඡායාරූපයක්ද දැක්වී තිබුණි. එම ඡායාරූපයේ ඇස් ආවරණය කොට තිබුණේ අනන්‍යතාවය සැඟවීමේ උපක්‍රමයක් ලෙසිනි. කෙසේ නමුත් මෙහිදී සැලකිල්ලට ගත යුත්තේ, එදින සහ ඊට පෙර දින මෙම සිදුවීම වාර්තා කළ, අපගේ නිරීක්ෂණයට ලක්වූ එකදු මුද්‍රිත මාධ්‍යයක හෝ මෙම බාලවයස්කාර සාමණේර හිමිනමගේ ඡායාරූපය පළවී නොතිබූ බවයි.

මෙම කරුණු සියල්ල පසුතලයේ තබා බැලූ විට, මව්බිම පුවත්පත පමණක් දැස් ආවරණය කර හෝ එම බාලවයස්කාර සාමණේර හිමියන්ගේ ඡායාරූපය දක්වා ඇත්තේ මන්ද? දැස් ආවරණය් කිරීම ඔස්සේ පමණක් එම බාලවයස්කාර සාමණේර හිමිනමගේ අනන්‍යතාවය ආරක්ෂා වනු ඇතැයි ඔබ සිතන්නේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:
https://www.editorscode.org.uk/the_code.php
https://www.ipso.co.uk/member-publishers/guidance-for-journalists-and-editors/guidance-on-reporting-of-sexual-offences/

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima